හපුතලේ නගර සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින්වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දින හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ විවිධ වියදම් හා මිලදී ගැනීම් වෙනුවෙන් වූ රු.212,751 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ප්‍රවර්තන වර්ෂය තුළ මිලදීගත් රු.185,280 ක් වටිනා ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ගෙවිය යුතු මුදල් සමුච්චිත අරමුදලට ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ රු.717,150 කට මිලදීගත් යන්ත්‍ර හා උපකරණ වල වටිනාකම රු.951,150 ක් ලෙසට ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.63,661,805 ක වත්කම් විෂයයන් 02 ක් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි, තක්සේරු වාර්තා,විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව ලේඛනගත නොවීම නිවැරදි කිරීම සඳහා විෂය නිලධාරී දැනුවත් කර ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥාපනත | | | |
| (i)170(අ)වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,672,549 ක හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. | නගරසභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ආරම්භ කර ඇත. |
| (ii)180 වගන්තිය | 2015,2016, 2017 හා 2018 වෙනුවෙන් ලැබීම් හා ගෙවීම් සහ පරිපාලනය පිළිබඳව වාර්තාවක් සභාවට හා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නගරසභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2015, 2016 හා 2017 යන වර්ෂ වල නිලධාරී පාලනයක් පැවති අතර 2018 වර්ෂයේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් සකස් කර නොතිබුණි, එහෙත් 2019 වර්ෂය අවසානයේදී එකී වාර්තාව සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 371 | සභාව අවස්ථා 12 කදී දෙන ලද එකතුව රු.140,480 ක අතුරු අග්‍රිමය පියවා නොතිබුණි. | අග්‍රිම පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර 21 ක පමණ කාලයක සිට මෙම ශේෂයන් පැවත එන අතර, මේ සම්බන්ධව සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන බැවින් අත්තිකාරම් පියවීම අපහසුවී ඇති බව සහ මේ පිළිබඳව තවදුරටත් සොයා බැලීමට විෂය නිලධාරී දැනුවත් කර ඇත. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් තක්සේරු කළයුතු වරිපනම් අය කරන දේපළ 2007 වර්ෂයෙන් පසුව තක්සේරු නොකර වරිපනම් බදු අය කරමින් පැවතුණි. | | ප්‍රධාන තක්සේරු නිලධාරියාගෙන් විටින්විට මේ සඳහා ඉල්ලීම් කර ඇතත් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර මෙම වර්ෂයේදී හෝ මෙම දේපල තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,665,338 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,135,459 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,845,351 | 1,845,351 | 1,565,961 | 279,391 | 1,843,076 | 1,843,076 | 1,644,528 | 429,308 |
| (ii) | කුලී | 16,444,277 | 16,444,277 | 10,529,520 | 5,914,757 | 10,569,732 | 10,569,732 | 7,962,686 | 2,607,046 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 325,000 | 325,000 | 737,002 | - | 805,000 | 805,000 | 586,937 | 218,063 |
| (iv) | වෙනත් ආදායම් | 1,057,921 | 1,057,921 | 565,185 | 492,736 | 1,539,635 | 1,539,635 | 873,440 | 666,195 |
| | එකතුව | 19,672,549 | 19,672,549 | 13,397,668 | 6,686,884 | 14,757,443 | 14,757,443 | 11,067,591 | 3,920,612 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.19,672,549 ක් මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.6,686,884 ක් අය කර නොතිබුණු අතර,එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 34 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වූ වැඩසටහනක් හා ක්‍රියාමාර්ගයක් සැලසුම් කර ඇත. |
| (ආ) | වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින ජල ගාස්තු,තරාදි කුලී, තානායම් ගාස්තු රු.4,967,666 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජල ගාස්තු 2007 වර්ෂයේ සිට පවතින ශේෂයක් වන අතර මේ සම්බන්ධව ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයෙන් විමසීම් කර ඇතත් පිළිතුරු ලැබී නොමැත. හිඟ තරාදි ගාස්තු අයකර ගැනීම සඳහා අදාල පුද්ගලයා දැනුවත් කර ඇතත් මේ දක්වා මුදල් ලැබී නැත. හිඟ තනායම් ගාස්තු සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති අතර මේ සම්බන්ධව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක්ද විභාග වෙමින් පවතී. |

2.2.3 වරිපනම් බදු හා කුලී ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.1,845,351 ක් වූ වරිපනම් බදු ආදායමෙන් දෙසැම්බර් 31 දිනට රු.279,391 ක් රැස්කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | මේ වනවිට රු.30,458 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.16,444,277 ක් වූ කුලී ආදායම් වලින්න් දෙසැම්බර් 31 දිනට රු.5,914,757 ක් අයකර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | මේ වනවිට රු.1,133,213 ක් අයකර ගෙන ඇති අතර ,රු.2,870,576 ක් දිනපතා වෙළඳපොලේ පවතින හිඟය බව සහ ව්‍යාපාරික ආදායම සම්බන්ධයෙන් මතුවී ඇති ගැටළුව මත ගෙවීම් පැහැර හරිමින් පවතී. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.282,910 ක් විය. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | මුදල් නොලැබුණු මාස වලට අදාල උපලේඛන සකස් කර යවා ඇති අතර එම මුදල් ලබාගැනීමට කටයුතු කරමි. |
| (ආ) මුද්දර ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.1,209,641 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 ජනවාරි මසදී රු.684,476 ක් ලැබී ඇති අතර ඉතිරි මුදල් කඩිනමින් ලබාගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 25 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉන් කාරණා 24 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා පළාත් සභාව වෙත යොමුකොට නීත්‍යානුකූල කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්ව තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ආදායම් ණය ගැතියෝ රු. 16,057,332 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණයගැතියන්ගෙන් 2019 අප්‍රේල් 30 දින වන විට රු.350,435 ක් පියවා ගෙන ඇත. |

3.3 <u>හඳුනාගත් පාඩු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිනපතා වෙළඳපලේ අංක 05 දරන ගව මස් කඩයේ ටෙන්ඩර්කරු ගිවිසුම් කොන්දේසි කඩ කිරීම හේතුවෙන් ව්‍යාපාරික කටයුතු අත්හිටුවා තිබුණි. ටෙන්ඩර්කරු ගෙවා තිබුණු තැන්පතු මුදලින් සභා අරමුදලට බැර කළ යුතු රු.648,340 ක් ආපසු ටෙන්ඩර්කරුට ගෙවීම මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි. | සභාවට අලාභයක් නොවන පරිදි කටයුතු කළ යුතුවේ. | මෙම ප්‍රසම්පාදනය සිදුකිරීමේදී අනුගමනය කළ යුතු සියළුම ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ඇති අතර, නගර සභාවට පාලනය කළ නොහැකි තත්ත්වයන් මත වර්ෂයට අදාලව ඉපයිය යුතු මුදල් උත්පාදනය කිරීමට නොහැකි විය. |

3.4 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | 2018 දෙසැම්බර් 05 දින අභ්‍යන්තර විගණනයක් සිදුකළ අතර මෙහි වාර්තාව 2019 ජනවාරි මස ඉදිරිපත් කර ඇත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සිදු කළ යුතුවේ. |